83424

AL/2020/71/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ..........................

**උපදෙස්:**

* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා** භාර දෙන්න.

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. සිංහල අක්ෂර මාලාවෙහි එන 'ය්' යන්න කවර ගණයකට අයත් අක්ෂරයක් ද?

(1) මූර්ධජ අඝෝෂ ඌෂ්ම
(2) තාලුජ අඝෝෂ අර්ධ ස්වර
(3) තාලුජ ඝෝෂ අර්ධ ස්වර
(4) කණ්ඨෞෂ්ඨජ අඝෝෂ
(5) දන්තෞෂ්ඨජ ඝෝෂ අර්ධ ස්වර (......)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) ප්‍රස්ථාවනා, උච්චාරණ, නෂ්ඨාවශිෂ්ට, නික්ලේශී, පළතුරු
(2) ප්‍රස්ථාවනා, උච්ඡාරණ, නශ්ටාවශිෂ්ට, නික්ලේෂී, පලතුරු
(3) ප්‍රස්තාවනා, උච්චාරණ, නෂ්ටාවශිෂ්ට, නික්ලේශී, පලතුරු
(4) ප්‍රස්ථාවනා, උච්චාරණ, නෂ්ඨාවශිෂ්ඨ, නික්ලේෂී, පළතුරු
(5) ප්‍රස්තාවනා, උච්ඡාරණ, නෂ්ඨාවශිෂ්ඨ, නික්ලේශී, පලතුරු (......)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ජගන්මාතා, ඥාන විභාගය
(2) ඥාන විභාගය, ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ජගන්මාතා
(3) ජගන්මාතා, ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ඥාන විභාගය
(4) ජංගම පුස්තකාලය, ජගන්මාතා, ඥාන විභාගය, ජ්‍යාමිතිය
(5) ජගන්මාතා, ජංගම පුස්තකාලය, ඥාන විභාගය, ජ්‍යාමිතිය (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මහාප්‍රාණ අක්ෂරයක් වචනයක මුල නො යෙදේ.
(2) මහාප්‍රාණ අක්ෂර දෙකක් වචනයක එක ළඟ නො යෙදේ.
(3) මහාප්‍රාණ අක්ෂරයකට පසු ව අනුස්වාරය භාවිත නො වේ.
(4) මහාප්‍රාණ අක්ෂරයකට මුලින් විසර්ගය නො යෙදේ.
(5) අල්පප්‍රාණ අක්ෂරයකට මුලින් මහාප්‍රාණ අක්ෂරයක් යෙදේ. (......)

1.5. එකිනෙකට අනුරූප වන සේ යෙදුණු වචන යුගල සහිත වරණය තෝරන්න.

(1) සමරු දෙසුම, මඟුල් බණ, වෙද මැඳුර, රස ගඟුල
(2) සමරු දේශනය, වෛද්‍ය මන්දිරය, විද්‍යා පිබිදුම, සූර්ය එළිය
(3) ආලෝක දහර, සාංවත්සරික උලෙළ, උයන් ක්‍රීඩා, සඳ පහන
(4) දිය කෙළිය, ස්වර සංකේත, සාපේක්ෂ ගනකම, විෂය දැනුම
(5) තෘණ පඳුරු, මේස නද, ගුවන් යාත්‍රාව, ස්ඵෝටන හඬ (......)

[දෙවැනි පිටුව බලන්න.

1.6. තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
- (1) ජලය, විදුලිය, වාතය, සුළඟ
- (2) විද්‍යුතය, ධ්වනිය, නාදය, නිද්‍රාව
- (3) පද්‍ය, සූක්ෂ්ම, පිළිවෙත, මඬුල්ල
- (4) පුෂ්පය, පරාගය, රොන්සුණු, දම්කඳ
- (5) සඟපෙළ, අභියාචනය, වලාකුළු, වායුධාරාව (......)

1.7. තද්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
- (1) සංසාරය, නිර්වාණය, බුදුසසුන, මෝහය
- (2) ජනගහනය, චේතනාව, මෝහනය, සැඳෑ අඳුර
- (3) දියදම්, ගමන්මඟ, ගුවන්ගැබ, විසුළු මුහුණ
- (4) සොබාදහම, අයුක්තිය, අටලෝදහම, ගුණදායක
- (5) මියුරු නාදය, බව තිමිර, තාලරූප, හස්තලීලා (......)

1.8. අව්‍යය සමාස, විශේෂණ සමාස, විභක්ති සමාස, අන්‍යාර්ථ සමාස අනුපිළිවෙළින් යෙදී ඇති වචන පේළිය තෝරන්න.
- (1) පාපියුම්, සුවඳ, සරාසඳ, දසබල
- (2) සරාසඳ, පාපියුම්, සුවඳ, දසබල
- (3) සුවඳ, දසබල, පාපියුම්, සරාසඳ
- (4) දසබල, සුවඳ, පාපියුම්, සරාසඳ
- (5) සුවඳ, පාපියුම්, සරාසඳ, දසබල (......)

1.9. කෘදන්තයක් **නො වන** වචනයක් අන්තර්ගත වරණය තෝරන්න.
- (1) කැඩූ, බැලූ, බිණූ, මැරූ
- (2) කැඩුම්, බැලුම්, බිණුම්, රැකුම්
- (3) පිසමන්, වියමන්, කියමන්, ලියමන්
- (4) නටන, බණින, බලන, බසින
- (5) නැටිලි, පැනිලි, බැලිලි, පැතලි (......)

1.10. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් **ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
- (අ) "බලා පලා **යව** අස්වන් ගුරුළු කෙත"
- (ආ) "**සිඳිත** මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ"
- (ඉ) "ගව්වෙන් ගව්ව දිව මාලිග **සැදේවා**!"
- (ඊ) "**දමාලා** යන නරක කුණු කය..."

- (1) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
- (2) පූර්වක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
- (3) අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා
- (4) ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා
- (5) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා (......)

1.11. තද්ධිතයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
- (1) තොටි, නැවි, පිනි, සැබි
- (2) කෙටි, ගැමි, රැටි, ලෙවි
- (3) දැහැමි, නැකැති, ඇදිරි, සිඟිති
- (4) වකුටු, කරටි, පහටි, පැනිති
- (5) අරටු, ඉඟටි, කඩිති, කළටි (......)

1.12. උපසර්ගයක් **යෙදී නොමැති** වචනයක් සහිත වරණය තෝරන්න.
- (1) සමාගම, සමුපකාර, සංවරණ, සංවර්ධන
- (2) අනුකූල, අනුනායක, අනුරූප, අනුශාසන
- (3) විරූප, විදේශ, විගමන, විකාල
- (4) අවතරණ, අවමාන, අවධාරණ, අවනම්බු
- (5) කුකවි, කුකුළු, කුදිටු, කුමන්ත්‍රණ (......)

1.13. නිපාතයක් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
- (1) අතර, අන්න, අනුව, අනේ
- (2) එක්කෝ, එපා, එහෙත්, දැන්
- (3) හෙයින්, හෙවත්, හොත්, හෝ
- (4) පරිදි, පසු, පිණිස, පිළිබඳ
- (5) නැවත, නිතර, කරා, නෑම (......)

1.14. **අතිශයෝක්ති** අලංකාරය භාවිතයෙහි ලා **ප්‍රබුද්ධ** කවිහු **උද්‍යෝගිමත්** වෙති.

යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණාංගවලට ද?
- (1) සන්ධි, උපසර්ග, තද්ධිත
- (2) සන්ධි, තද්ධිත, උපසර්ග
- (3) උපසර්ග, තද්ධිත, සන්ධි
- (4) තද්ධිත, සන්ධි, උපසර්ග
- (5) උපසර්ග, සන්ධි, තද්ධිත (......)

[තුන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ ඇතුළත් **නො වන** ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) කියවූ, කරවූ, පෙන්වූ, ඇවූ
(2) පැවසූවා ය, පෙන්වූවා ය, විමසූවා ය, වැනසූවා ය
(3) කියූහ, දැක්වූහ, පැවසූහ, ලියූහ
(4) ඇසූ, නැසූ, පිසූ, විසූ
(5) කරයි, දුවයි, බලයි, කියයි (......)

1.16. සමාසයක් **නො වන** වචනයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අකුසල්, අයහපත්, උපකාර, යාවජීව
(2) ගත්කරු, බුදුගුණ, මල්පොකුර, සඳඑළිය
(3) අරමුණු, පොල්තෙල්, බලුනකුට, සිල්රෙදි
(4) පොතපත, මල්දම්, රියපොළ, හිරුසඳු
(5) කළුකෙස්, දිගගවුම, නිලුපුල්, රතුමල් (......)

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.
(1) අරුණාලෝක, නරේන්ද්‍ර, ස්වෝත්සාහ, මහාධිකරණය
(2) ලෝකෝත්තර, පුරුෂෝත්තම, විද්‍යෝදය, බහූපකාර
(3) ජාතිකානුරාගය, දෑගසවු, බුත්සරණ, බුද්ධීන්ද්‍රිය
(4) අග්‍රාමාත්‍ය, ආත්මාරක්ෂාව, උපමාලංකාර, අමාත්‍යාංශය
(5) මලසුන, අල්ලස්, ඉන්නල, උනුන් (......)

1.18. ව්‍යාකරණානුකූල ව **නො ගැළපෙන** වරණය කුමක් ද?
(1) දකුණත, යනෙන, සුරිඳු, හිඟුරල
(2) මැටිබඳුන්, කිරිබත්, රන්කම්, මිරිස්කුඩු
(3) විසින්, බඳු, නොහොත්, කෙරෙන්
(4) අප, උප, අදි, අති
(5) ස්වර්ණමය, රන්මුවා, සිල්වත්, බීමත් (......)

1.19. ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) මාර්ග නීති උල්ලංඝනය කළ සිවුදෙනකු අත්අඩංගුවට ගන්නා ලදි.
(2) සියලු ඥාති මිත්‍රාදීන් මේ නිවේදනය පිළිගනිත්වා!
(3) රජතුමා විසින් සඟමිත් මෙහෙණින් වහන්සේ ගරු බුහුමනින් පිළිගන්නා ලදි.
(4) දියණියන් ආපසු ගමට ගියා ය.
(5) ජනතාව හමුවේ දේශපාලකයන් ආදර්ශවත් ව කටයුතු කළ යුතු ය. (......)

1.20. ලේඛන ව්‍යවහාරයට අනුකූල වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) ඇමති මණ්ඩලයේ පදවි බාර ගන්න ඇතැමුන් ඉදිරිපත් වෙන්නේ නැහැ.
(2) කාගේවත් වරදක් කියන්නට කමක් ඇත්තේ නැතැයි මා විසින් කීවා.
(3) කොළඹට පැමිණි මොහු පිටරට යුද පිණිස නැව් නැඟුමට යෙදුණා.
(4) ඔවුන් නිසා දැන් ගම්වලත් ඒ සිරිත පැතිරෙනවා.
(5) මේ කතාව ඉදිරිපත් කරන්නේ ගැමියකුගේ දෘෂ්ටිකෝණයෙනි. (......)

(ලකුණු 20 යි.)

* *

[හතරවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සාහිත්‍යකරුවා ද සෙසු මනුෂ්‍යයන් මෙන් සමාජයක ජීවත් වන්නෙකි. එහෙත් සමාජයේ ජීවත් වන සෙස්සන්ට වඩා ඇතැම් විශේෂතා ඔහු තුළ විද්‍යමාන වේ. නිරීක්ෂණ කෞශල්‍යයක් හා වින්දන ශක්තියක් ඔහු තුළ පිහිටා ඇත්තේ ය. ඔහු සූක්ෂ්මදර්ශී ය; සමාජයේ ඇති වන දුක-සැප, දොම්නස-සොම්නස, බැඳුම්-ගැටුම් විනිවිද දකී. ඒවා ඔහුගේ අමුද්‍රව්‍ය වන්නේ ය. එම අමුද්‍රව්‍ය ඇසුරින් ඔහු අපූරු කල්පනා ලෝකයක් නිර්මාණය කරයි. මෙනයින් බලන කල කවර උසස් සාහිත්‍ය කෘතියක වුව ද තැන්පත් වන්නේ රචකයා වෙසෙන සමාජයේ ජීවය යි; හරය යි. සිය කාර්යභාරය මැනවින් වටහා ගත් සාහිත්‍යකරුවා කාලීන සමාජ හරය පිළිබිඹු කිරීමෙන් පමණක් සෑහීමකට පත් නො වේ. ස්වකීය පුද්ගල දෘෂ්ටියට අනුව, සමාජයේ ප්‍රගතියට හේතු වන පරිද්දෙන්, තත්කාලීන සමාජයේ අඩුලුහුඬුකම් ද දක්වයි. සාහිත්‍යකරුවාගෙන් ජන සමාජයට සැලසෙන එක් වැදගත් මෙහෙයක් නම් අවටැති සමාජය පැහැදිලි ලෙස සිතුවම් කොට, සමාජ උන්නතියට අනර්ථකාරී වූ බලවේගයන්ගේ තථ්‍ය ස්වරූපය විශද කොට, ඒවා මූලෝත්පාටනය කිරීමට අනුබල දීම යි.

කවර සාහිත්‍යාංගයකට වුව ද පාදක වන්නේ අවටැති සමාජ ජීවිතයේ හරය යි. එහෙත් මෙකී ලක්ෂණය වඩාත් පැහැදිලි ලෙසත්, පරිපූර්ණ ලෙසත්, දක්නට ලැබෙන්නේ නවකථාවෙහි ය. කවියාටත් නාට්‍යකරුවාටත් යම් යම් සීමාවන් ඇතුළත ක්‍රියා කිරීමට සිදු වන්නේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් අභිමුඛයෙහි ඇති විෂය ක්ෂේත්‍රය එක්තරා ප්‍රමාණයකට පටු වේ. එහෙත් නවකථාකරුවා බැඳ තබන සීමා නැත; ඇත්නම් අල්පයකි. එහෙයින් අවශේෂ ලේඛකයන්ට වඩා තියුණු වූත් ගැඹුරු වූත් ආකාරයෙන් සමාජ ජීවිතය නිරූපණය කිරීමේ වරප්‍රසාදය නවකථා රචකයාට හිමි වන්නේ ය. නවකථාව වනාහි සමාජය හමුවේ තබා ඇති කැඩපතකි. එය දෙස බලන පාඨකයාට තමාගේත් සමාජයේත් අඩුලුහුඬුකම් ප්‍රත්‍යක්ෂ වේ. ඒ නිසා පොදුවේ සැම උසස් සාහිත්‍ය කෘතියකටත් විශේෂ වශයෙන් නවකථාවටත් සමාජ අර්ථයක් පදනම් වන බව කිව මනා ය.

(i) මෙහි සඳහන් වන ආකාරයට සෙසු මනුෂ්‍යයන්ට වඩා සාහිත්‍ය නිර්මාණකරුවා තුළ දක්නට ලැබෙන විශේෂතා **දෙක** කවරේ ද?

(ii) සාහිත්‍ය රචකයා ස්වකීය කෘති රචනය සඳහා අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කරන්නේ මොනවා ද?

(iii) සාහිත්‍යකරුවාගෙන් ජන සමාජයට සැපයෙන මෙහෙය වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(iv) කවියාගේත් නාට්‍යකරුවාගේත් විෂය ක්ෂේත්‍රය පටු වන්නේ කවර හේතුවක් නිසා ද?

(v) අවශේෂ ලේඛකයන්ට වඩා නවකථා රචකයාට ඇති වරප්‍රසාදය කුමක් ද?

(vi) නවකථාව නමැති කැඩපත දෙස බලන පාඨකයාට ප්‍රත්‍යක්ෂ වන්නේ කුමක් ද?

(ලකුණු 12 යි.)



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

වසර දහසකට අධික කාලයක් අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍ර කොට ගෙන රජරට ව්‍යාප්ත ව පැවති සිංහල ශිෂ්ටාචාරය කෙටි කාලයක් තුළ දී පරිහානිය කරා ගමන් ගත්තේ ය. පළමු වන පරාක්‍රමබාහු රජ දවස උච්චස්ථානයක පැවති දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික සමෘද්ධිය හා ශාසනික උන්නතිය ඔහුගේ අභාවයෙන් දශක තුනක් වැනි කෙටි කාලයක් ඇතුළත දුර්වල තත්ත්වයකට පත් විය. මෙවැනි තත්ත්වයක් උදා වීමට හේතු වූයේ දේශපාලන අස්ථාවරත්වය හා විදේශ ආක්‍රමණ යි. මාඝ ආක්‍රමණය, චන්ද්‍රභානු ආක්‍රමණ, පාණ්ඩ්‍ය ආක්‍රමණ මෙකල එල්ල වූ ප්‍රබල විදේශ ආක්‍රමණ යි. විශේෂයෙන් ම මාඝ ආක්‍රමණය පෙර නො වූ විරූ ආකාරයේ ඉතා දරුණු එකක් විය. කේරළ කුලී හේවායන් විශාල සංඛ්‍යාවකින් යුත් සේනාවක් සමග පැමිණ මෙරට පාලකයා ව සිටි පරාක්‍රම පාණ්ඩ්‍ය නෙරපා දමා දරුණු ක්‍රියාකලාපයක් අනුගමනය කරමින් පොළොන්නරුව අල්වා ගෙන එහි දී අභිෂේකය ලබා ඔහු ස්වකීය ආධිපත්‍යය පැතිරවී ය. දීර්ඝ කාලයක් මෙසේ සිටිමින් මාඝ අනුගමනය කළ ක්‍රියාකලාපය රජරට ශිෂ්ටාචාරයේ ඉරණම කෙරෙහි තීරණාත්මක අයුරින් බල පෑ බව පෙනේ. ඔහු සිංහල බෞද්ධයන් තුළ චිරස්ථායී ව පැවති සමාජ සංවිධානය, කුල චාරිත්‍ර, ආර්ථිකයේ ජීවනාලිය වූ වාරිමාර්ග පද්ධතිය, සාහිත්‍යයේ මුදුන්මල්කඩ වූ වටිනා පොත්පත්, බෞද්ධ සිද්ධස්ථාන විනාශ කරමින් භික්ෂූන් වහන්සේලාට, ප්‍රභූ පන්තියට හා සාමාන්‍ය ජනතාවට වධහිංසා පමුණුවමින් සිංහල බෞද්ධ සභ්‍යත්වය විනාශ කරමින් රජරට ශිෂ්ටාචාරය කඩා බිඳ දැමී ය.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ ඉගැන්වීමේ ක්‍රියාවලියට විද්‍යුත් මාර්ගගත (online) ක්‍රමය හඳුන්වා දීම
(ii) වසංගත රෝග ව්‍යාප්තිය මගින් ගෝලීය ආර්ථිකයෙහි පැවැත්ම කෙරෙහි සිදු කෙරෙන බලපෑම
(iii) ආනයනය කළ ආහාර ද්‍රව්‍ය මත පමණක් යැපීමේ දී රටකට මුහුණ පෑමට සිදු වන අභියෝග
(iv) නවීකරණය හමුවේ අභියෝගයට ලක් වන ශ්‍රී ලාංකේය චාරිත්‍ර - වාරිත්‍ර
(v) විද්‍යා හා තාක්ෂණික ඥානය කෙරෙහි අසීමාන්තික ව යොමු වීම නිසා පසුබෑමකට ලක් වන මෙරට සාහිත්‍ය කලා

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) කාශ්‍යප රජතුමා කලාකාමියකු විය.
(ii) පරහිතකාමී මනුෂ්‍යයෝ දෙවිවරු මෙන් ලෝකය දීප්තිමත් කරති.
(iii) උකුස්සා විසින් හාවකු හා මීයෙක් අල්ලා ගන්නා ලදහ.
(iv) සෞඛ්‍ය සේවකයා රෝගීහු රෝහලට ඇතුළත් කිරීමට කඩිනම් පියවර ගත්තේ ය.
(v) ශිෂ්‍ය නායකයා ද වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා ද උදෑසන රැස්වීමේ දී අදහස් දැක්වූහ.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ඇමතිතුමා නව ලේකම්වරියක පත් කරයි.
(ii) අභිගුණ්ඨිකයා නයින් දෙදෙනෙකු අල්ලා ගනී.
(iii) ශාලාධිපතිවරයා විහාග නීති උල්ලංඝනය කළ සිසුවකු ශාලාවෙන් ඉවත් කෙළේ ය.
(iv) සිරි රාහුල් හිමියෝ කාව්‍යශේඛරය රචනා කළහ.
(v) නිලධාරීහු ආරක්ෂක භටයන් ලවා මඟ යනෙන මිනිසුන් හා වාහන පරීක්ෂා කරවති.

(ඉ) ව්‍යාකරණානුකූල වාක්‍යයක් නිර්මාණය කිරීමට යෝග්‍ය පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (පරිසරවේදීහු/පරිසරවේදීන්) වන සංරක්ෂණය සඳහා (ශිෂ්‍යයෝ/ශිෂ්‍යයන්) යොමු කළහ.
(ii) ජනප්‍රිය (නිළියක්/නිළියක) රැස්වීම අමතතොත් (ඡන්දදායකයෝ/ඡන්දදායකයන්) සතුටු වනු ඇත.
(iii) (ශිෂ්‍ය නායකයන්/ශිෂ්‍ය නායකයෝ) විසින් (නවක සිසුහු/නවක සිසුන්) පිළිගනු ලැබූහ.
(iv) අම්මා හා තාත්තා සමඟ (මා/මම) ද උත්සවයට සහභාගි (වීමු/වීමි).
(v) (ව්‍යාපාරිකයන්/ව්‍යාපාරිකයෝ) පරිසරය විනාශ කරද්දී (දේශපාලකයෝ/දේශපාලකයන්) නිලධාරීන්ට තර්ජනය කරති.

(ලකුණු 05 × 3 =15 යි.)

[හයවැනි පිටුව බලන්න.

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **කීර්තිමත් ප්‍රදේශාධිපතියෝ ගුණදහමින්** ආඪ්‍ය ව සිටිති.
(**කීර්තිමත්** - තද්ධිත, **ප්‍රදේශාධිපති** - සන්ධි, **ගුණදහම්** - සමාස)

(ii) **තුරුවදුලෙහි සුපිපි වනමල්** එහි ම මිලින ව යයි.
(**තුරුවදුලෙහි** - විභක්ති, **සුපිපි** - උපසර්ග, **වනමල්** - සමාස)

(iii) **විනිසකරු** අංක 70 **දරන** නඩුව **නිෂ්ප්‍රභ** කරයි.
(**විනිසකරු** - සමාස, **දරන** - කෘදන්ත, **නිෂ්ප්‍රභ** - උපසර්ග)

(iv) රූබර ලලනාවෝ **මිණිබරණ ද රනබරණ** ද අභිරුචියෙන් පලඳිති.
(**මිණිබරණ** - සන්ධි, **ද** - නිපාත, **රනබරණ** - සන්ධි)

(v) **අකෘතඥයෝ පාපතර** ක්‍රියාවන්හි **ම** නිරත වෙති.
(**අකෘතඥයෝ** - විභක්ති, **පාපතර** - තද්ධිත, **ම** - නිපාත) (ලකුණු 03 × 5 =15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට අර්ථානුකූල ව වඩාත් ම ගැළපෙන වචනය වරහනින් තෝරා ලියන්න.

(i) ........................ කියවිය හැකි සන්දේශ සිංහල සන්දේශාවලියෙහි සුලබ නො වේ.

(ii) නකත් බලවන, පෙරනිමිති සලකන මිනිසුන් ........................ පාත්‍ර කරන කථා වස්තු ජාතක පොතෙහි හිඟ නො වේ.

(iii) මිනිසාගේ චින්තනයට භාෂාව කෙතෙක් දුරට උපකාරි වේ ද යන්න ........................ ප්‍රශ්නයකි.

(iv) ලක්වැසි ජනතාව තුළ තමන් සිංහලයන් ය යන හැඟීම ක්‍රියාත්මක වූයේ කවර කලෙක පටන් ද යන්න මෑතක සිට ඇතැම් උගතුන් අතර ........................ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ.

(v) ශෛලිය හා වාග්විලාසය සකස් වීම කෙරෙහි ලේඛනයේ ........................ ද බල පාන බවට මෙය සාධකයකි.

(vi) සමකාලීන භාෂණ ව්‍යවහාරය ලේඛන කාර්යය සඳහා යොදා ගැනීමේ ........................ ඇල්බට් ද සිල්වා මිදුණු බව පෙනේ.

(විවාදාත්මක, නවතායෙන්, මනෝවිද්‍යාත්මක, වස්තු විෂයය, සම්ප්‍රදායයෙන්, පරිහාසයට)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

පරාක්‍රමබාහු මුළු දිවයිනට ම අදිපති වී අබිසේක ලැබුවට පස්සේ පොලොන්නරුවේ තැනවූ මාලිගාව පඬුවස් නුවර මාලිගාවට සමාන නමුත් මහතින් ඊට ලොකු යි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) බල්ලා **බළලා** එළවා දමයි.
(ii) **බළලා** මීයා මරයි.
(iii) **ගසෙහි** අත්තක් කඩා වැටේ.
(iv) කුරුල්ලෙක් **ගසෙහි** වසයි.
(v) ළමයා **ගසට** වතුර දමයි.
(vi) ළමයා **අතින්** පොත බිමට වැටෙයි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

එහෙත් භාෂණය කරන්නේ සමාජය සමස්තයක් වශයෙන් නො වේ භාෂක සමාජයේ සාමාජිකයන් එනම් පුද්ගලයන් වශයෙනි එසේ නම් එය පෞද්ගලික වූවකැයි නො කිව යුතු ද

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) රාජ පුරුෂයන්ගේ බස් ඇසූ රජ "පුරෝහිතයා කෙසේ මරම් දැ"යි කී ය.
(ii) "යන්නට එපා, අත්ත කඩා ගෙන වැටෙයි" යනුවෙන් යාළුවෝ කීහ.
(iii) "යුෂ්මතාගේ නිර්දෝෂීභාවයට යමක් ඇත්නම් කියන්න" යි විනිශ්චයකාරවරයා පැවසී ය.

(ලකුණු 01 × 3 = 03 යි.)

[හත්වැනි පිටුව බලන්න.

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලක්දිව **ඓතිහාසිකත්වයෙන්** සැලකෙන **ආදිතම** ජනාවාස පිහිටුවූ යුගය වශයෙන් **උපකල්පිත වූ** කාලයෙහි සිට සියවස් දෙක හමාරක් පමණ වූ කාල පරිච්ඡේදයක් ඇතුළත, එනම් ක්‍රි. පූ. 3 සියවසේ දී මේ රටේ බුදු සසුන **සංස්ථාපිත** වූ තැන් පටන් චිරස්ථායී වන අයුරින් ලියැවුණු **පුරාලිපි** රැසක් ද අනුරාධපුර අවධියේ **ද්විතීය** භාගයට අයත් සීගිරි කුරුටු ගී ඇතුළු සාහිත්‍යමය ලේඛන හා ග්‍රන්ථ කීපයක් ද අප සතු ව තිබේ. මෙසේ සිංහල භාෂාවෙන් වාර්තාගත වී ඇති ආදිතම ලේඛන වන සිය ගණනක් පුරාලිපි හා ග්‍රන්ථ කීපය අතුරෙන් අඩු තරමින් භාෂා ඉතිහාසයේ යුග ලක්ෂණ නියෝජකත්වය අතින් වැදගත් සේ පෙනෙන ලිපි සැහෙන ප්‍රමාණයක් වත් පරීක්ෂා කර බැලීමෙන්, වඩාත් හේතු යුක්ති ඇත්තේ ඉහත කී මතාන්තර අතුරෙහි කවර මතයකට ද යන්න මෙන් ම භාෂාවේ පරිණාමය සිදු වී ඇත්තේ කවර අයුරින් ද යන්නත් තමන්ට ම ප්‍රත්‍යක්ෂ ලෙස වටහා ගත හැකි වේ.

(i) **කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

(ii) පිහිටුවූ, ඉතිහාසයේ, කුරුටු ගී යන වචනවල යෙදී ඇති පිළි හඳුන්වන්න.

(iii) මේ ඡේදයේ ඇතුළත් තද්ධිත පද **තුනක්** උපුටා දක්වන්න.

(iv) මේ ඡේදයේ ඇතුළත් ව්‍යංජන සංයුක්ත තුනක් සමග මූර්ධජ ඌෂ්මාක්ෂරයක් ඇතුළත් වචනයක් උපුටා දක්වන්න.

(v) ජනාවාස, මතාන්තර, වාර්තාගත යන වචන විසන්ධි කොට දක්වන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) නාම විශේෂණ

(ii) දකාරාර්ථ සමාසය

(iii) වත් හා මත් ප්‍රත්‍යය භාවිතය

(iv) ස්වරාදේශ සන්ධිය

(v) ප්‍රයෝජ්‍ය ක්‍රියාව

(ලකුණු 05 × 3 =15 යි.)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

II පත්‍රය

විෂය අංකය / பாட இலக்கம் **71** විෂයය / பாடம் **සිංහල**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I කොටස

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 3 | 11. | 1 |
| 02. | 3 | 12. | 5 |
| 03. | 4 | 13. | 5 |
| 04. | 2 | 14. | 1 |
| 05. | 1 | 15. | 1 |
| 06. | 2 | 16. | 3 |
| 07. | 3 | 17. | 4 |
| 08. | 5 | 18. | 5 |
| 09. | 5 | 19. | 5 |
| 10. | 5 | 20. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සාහිත්‍යකරුවා ද සෙසු මනුෂ්‍යයන් මෙන් සමාජයක ජීවත් වන්නෙකි. එහෙත් සමාජයේ ජීවත් වන සෙස්සන්ට වඩා ඇතැම් විශේෂතා ඔහු තුළ විද්‍යමාන වේ. නිරීක්ෂණ කෞශල්‍යයක් හා වින්දන ශක්තියක් ඔහු තුළ පිහිටා ඇත්තේ ය. ඔහු සූක්ෂ්මදර්ශී ය; සමාජයේ ඇති වන දුක-සැප, දොම්නස-සොම්නස, බැඳුම්-ගැටුම් විනිවිද දකී. ඒවා ඔහුගේ අමුද්‍රව්‍ය වන්නේ ය. එම අමුද්‍රව්‍ය ඇසුරින් ඔහු අපූරු කල්පනා ලෝකයක් නිර්මාණය කරයි. මෙනයින් බලන කල කවර උසස් සාහිත්‍ය කෘතියක වුව ද තැන්පත් වන්නේ රචකයා වෙසෙන සමාජයේ ජීවය යි; හරය යි. සිය කාර්යභාරය මැනවින් වටහා ගත් සාහිත්‍යකරුවා කාලීන සමාජ හරය පිළිබිඹු කිරීමෙන් පමණක් සෑහීමකට පත් නො වේ. ස්වකීය පුද්ගල දෘෂ්ටියට අනුව, සමාජයේ ප්‍රගතියට හේතු වන පරිද්දෙන්, තත්කාලීන සමාජයේ අඩුලුහුඬුකම් ද දක්වයි. සාහිත්‍යකරුවාගෙන් ජන සමාජයට සැලසෙන එක් වැදගත් මෙහෙයක් නම් අවටැති සමාජය පැහැදිලි ලෙස සිතුවම් කොට, සමාජ උන්නතියට අනර්ථකාරී වූ බලවේගයන්ගේ සත්‍ය ස්වරූපය විශද කොට, ඒවා මූලෝත්පාටනය කිරීමට අනුබල දීම යි.

කවර සාහිත්‍යාංගයකට වුව ද පාදක වන්නේ අවටැති සමාජ ජීවිතයේ හරය යි. එහෙත් මෙකී ලක්ෂණය වඩාත් පැහැදිලි ලෙසත්, පරිපූර්ණ ලෙසත්, දක්නට ලැබෙන්නේ නවකථාවෙහි ය. කවියාටත් නාට්‍යකරුවාටත් යම් යම් සීමාවන් ඇතුළත ක්‍රියා කිරීමට සිදු වන්නේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් අභිමුඛයෙහි ඇති විෂය ක්ෂේත්‍රය එක්තරා ප්‍රමාණයකට පටු වේ. එහෙත් නවකථාකරුවා බැඳ තබන සීමා නැත; ඇත්නම් අල්පයකි. එහෙයින් අවශේෂ ලේඛකයන්ට වඩා තියුණු වූත් ගැඹුරු වූත් ආකාරයෙන් සමාජ ජීවිතය නිරූපණය කිරීමේ වරප්‍රසාදය නවකථා රචකයාට හිමි වන්නේ ය. නවකථාව වනාහි සමාජය හමුවේ තබා ඇති කැඩපතකි. එය දෙස බලන පාඨකයාට තමාගේත් සමාජයේත් අඩුලුහුඬුකම ප්‍රත්‍යක්ෂ වේ. ඒ නිසා පොදුවේ සෑම උසස් සාහිත්‍ය කෘතියකටත් විශේෂ වශයෙන් නවකථාවටත් සමාජ අර්ථයක් පදනම් වන බව කිව මනා ය.

(i) මෙහි සඳහන් වන ආකාරයට සෙසු මනුෂ්‍යයන්ට වඩා සාහිත්‍ය නිර්මාණකරුවා තුළ දක්නට ලැබෙන විශේෂතා **දෙක** කවරේ ද?

(ii) සාහිත්‍ය රචකයා ස්වකීය කෘති රචනය සඳහා අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කරන්නේ මොනවා ද?

(iii) සාහිත්‍යකරුවාගෙන් ජන සමාජයට සැපයෙන මෙහෙය වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(iv) කවියාගේත් නාට්‍යකරුවාගේත් විෂය ක්ෂේත්‍රය පටු වන්නේ කවර හේතුවක් නිසා ද?

(v) අවශේෂ ලේඛකයන්ට වඩා නවකථා රචකයාට ඇති වරප්‍රසාදය කුමක් ද?

(vi) නවකථාව නමැති කැඩපත දෙස බලන පාඨකයාට ප්‍රත්‍යක්ෂ වන්නේ කුමක් ද?

(ලකුණු 12 යි.)

(අ)

i. 1. නිරීක්ෂණ කෞශල්‍යය

2. වින්දන ශක්තිය

**(කොටස් දෙක ම ඇත්නම් ලකුණු 02 කි. එක් කොටසකට ලකුණු 01 කි.)**

ii. 1. සමාජයේ ඇති වන දුක - සැප, දොම්නස - සොම්නස, බැඳුම් - ගැටුම්

**(කොටස් තුනට ලකුණු 02 කි. කොටස් දෙකකට ලකුණු 01 කි. එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නොවේ.)**

iii. අවට සමාජය පැහැදිලි ලෙස සිතුවම් කොට, සමාජයේ උන්නතියට අනර්ථකාරී වූ බලවේගයන්ගේ තථ්‍ය ස්වරූපය දක්වා ඒවා මූලෝත්පාටනය කිරීමට අනුබල දීම.
**(කොටස් තුනට ලකුණු 02 කි. කොටස් දෙකකට ලකුණු 01 කි. එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නොවේ.)**

iv. (කවියාට හා නාට්‍යකරුවාට) යම් යම් සීමාවන් ඇතුළත ක්‍රියා කිරීමට සිදුවීම

v. තියුණු වූත් ගැඹුරු වූත් ආකාරයෙන් සමාජ ජීවිතය නිරූපණය කිරීමේ හැකියාව ලැබී තිබීම.

vi. තමාගේත් (පාඨකයා) සමාජයේත් අඩුලුහුඬුකම්.

(ලකුණු 02 x 6 = 12 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

වසර දහසකට අධික කාලයක් අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍ර කොට ගෙන රජරට ව්‍යාප්ත ව පැවති සිංහල ශිෂ්ටාචාරය කෙටි කාලයක් තුළ දී පරිහානිය කරා ගමන් ගත්තේ ය. පළමු වන පරාක්‍රමබාහු රජ දවස උච්චස්ථානයක පැවති දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික සමෘද්ධිය හා ශාසනික උන්නතිය ඔහුගේ අභාවයෙන් දශක තුනක් වැනි කෙටි කාලයක් ඇතුළත දුර්වල තත්ත්වයකට පත් විය. මෙවැනි තත්ත්වයක් උදා වීමට හේතු වූයේ දේශපාලන අස්ථාවරත්වය හා විදේශ ආක්‍රමණ යි. මාඝ ආක්‍රමණය, චන්ද්‍රභානු ආක්‍රමණ, පාණ්ඩ්‍ය ආක්‍රමණ මෙකල එල්ල වූ ප්‍රබල විදේශ ආක්‍රමණ යි. විශේෂයෙන් ම මාඝ ආක්‍රමණය පෙර නොවූ විරූ ආකාරයේ ඉතා දරුණු එකක් විය. කේරළ කුලී භේවායන් විශාල සංඛ්‍යාවකින් යුත් සේනාවක් සමග පැමිණ මෙරට පාලකයා ව සිටි පරාක්‍රම පාණ්ඩ්‍ය නෙරපා දමා දරුණු ක්‍රියාකලාපයක් අනුගමනය කරමින් පොළොන්නරුව අල්වා ගෙන එහි දී අභිෂේකය ලබා ඔහු ස්වකීය ආධිපත්‍යය පැතිරවී ය. දීර්ඝ කාලයක් මෙසේ සිටිමින් මාඝ අනුගමනය කළ ක්‍රියාකලාපය රජරට ශිෂ්ටාචාරයේ ඉරණම කෙරෙහි තීරණාත්මක අයුරින් බල පෑ බව පෙනේ. ඔහු සිංහල බෞද්ධයන් තුළ චිරස්ථායී ව පැවති සමාජ සංවිධානය, කුල චාරිත්‍ර, ආර්ථිකයේ ජීවනාලිය වූ වාරිමාර්ග පද්ධතිය, සාහිත්‍යයේ මුදුන්මල්කඩ වූ වටිනා පොත්පත්, බෞද්ධ සිද්ධස්ථාන විනාශ කරමින් භික්ෂූන් වහන්සේලාට, ප්‍රභූ පන්තියට හා සාමාන්‍ය ජනතාවට වධහිංසා පමුණුවමින් සිංහල බෞද්ධ සභ්‍යත්වය විනාශ කරමින් රජරට ශිෂ්ටාචාරය කඩා බිඳ දැමී ය.

(ලකුණු 13 යි.)

(ආ) සාරාංශය (වචන 50 - 60)

- අනුරාධපුර හා පොළොන්නරුව කේන්ද්‍ර කොට ගෙන රජරට ව්‍යාප්තව පැවැති සිංහල ශිෂ්ටාචාරය පරිහානියට ලක්වීම.
- පළමුවන පරාක්‍රමබාහු රජ දවස උච්චස්ථානයක පැවැති දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික සමෘද්ධිය හා ශාසනික උන්නතිය ඔහුගේ අභාවයෙන් දශක තුනක කාලයක් ඇතුළත දුර්වල වීම.
- දේශපාලන අස්ථාවරත්වය හා විදේශ ආක්‍රමණ මෙයට ඉවහල් වීම.
- රජරට ශිෂටාචාරයේ ඉරණම කෙරෙහි මාඝගේ ආක්‍රමණ දැඩිව බලපෑම
- සිංහල බෞද්ධයන් තුළ පැවැති සමාජ සංවිධානය, කුල චාරිත්‍ර, වාරිමාර්ග පද්ධතිය, වටිනා පොත්පත් බෞද්ධ සිද්ධස්ථාන ඔහු විසින් විනාශ කිරීම.
- භික්ෂූන් වහන්සේලාට, ප්‍රභූ පන්තියට හා සමාන්‍ය ජනතාවට වධහිංසා දී. සිංහල බෞද්ධ සභ්‍යත්වය විනාශ කිරීම හා රජරට ශිෂ්ටාචාරය බිඳ දැමීම ද මාඝ ආක්‍රමණයෙන් සිදුවීම.

**ඉහත කරුණු ඇතුළත්ව ලේඛන ව්‍යවහරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇත්නම්, සමස්තයෙන් ලකුණු දෙකක් අඩු වේ. වචන**

සංඛ්‍යාව 50 — 60 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් ලකුණු 03ක් අඩු වේ.

| | | |
|---|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - | ලකුණු 02 යි. |
| අක්ෂර වින්‍යාසයට | - | ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - | ලකුණු 08 යි. |

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ ඉගැන්වීමේ ක්‍රියාවලියට විද්‍යුත් මාර්ගගත (online) ක්‍රමය හඳුන්වා දීම

(ii) වසංගත රෝග ව්‍යාප්තිය මගින් ගෝලීය ආර්ථිකයෙහි පැවැත්ම කෙරෙහි සිදු කෙරෙන බලපෑම

(iii) ආනයනය කළ ආහාර ද්‍රව්‍ය මත පමණක් යැපීමේ දී රටකට මුහුණ පෑමට සිදු වන අභියෝග

(iv) නවීකරණය හමුවේ අභියෝගයට ලක් වන ශ්‍රී ලාංකේය චාරිත්‍ර - වාරිත්‍ර

(v) විද්‍යා හා තාක්ෂණික ඥානය කෙරෙහි අසීමාන්තික ව යොමු වීම නිසා පසුබෑමකට ලක් වන මෙරට සාහිත්‍ය කලා

(ලකුණු 25 යි.)

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය

ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම

iii. කරුණුවල පැහැදිලි බව

iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම

v. ව්‍යාකරණ දෝෂ රහිත වීම

vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම

vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම

viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

- විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.

(ලකුණු 25 යි)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) කාශ්‍යප රජතුමා කලාකාමියකු විය.

(ii) පරහිතකාමී මනුෂ්‍යයෝ දෙවිවරු මෙන් ලෝකය දීප්තිමත් කරති.

(iii) උකුස්සා විසින් හාවකු හා මීයෙක් අල්ලා ගන්නා ලදහ.

(iv) සෞඛ්‍ය සේවකයා රෝගීහු රෝහලට ඇතුළත් කිරීමට කඩිනම් පියවර ගත්තේ ය.

(v) ශිෂ්‍ය නායකයා ද වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා ද උදෑසන රැස්වීමේ දී අදහස් දැක්වූහ.

i. කාශ්‍යප රජතුමා කලාකාමියෙක් විය.

i. [illegible]

ii. පරහිතකාමී මනුෂ්‍යයෝ දෙවිවරුන් මෙන් ලෝකය දීප්තිමත් කරති.

iii. උකුස්සා විසින් හාවෙක් හා මීයෙක් අල්ලා ගන්නා ලදහ.

iv. සෞඛ්‍ය සේවකයා රෝගීන් රෝහලට ඇතුළත් කිරීමට කඩිනම් පියවර ගත්තේ ය.

v. වාක්‍යය නිවැරදි ය.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ඇමතිතුමා නව ලේකම්වරියක පත් කරයි.
(ii) අභිගුණ්ඨිකයා නයින් දෙදෙනෙකු අල්ලා ගනී.
(iii) ශාලාධිපතිවරයා විහාග නීති උල්ලංඝනය කළ සිසුවක ශාලාවෙන් ඉවත් කෙළේ ය.
(iv) සිරි රහල් හිමියෝ කාව්‍යශේඛරය රචනා කළහ.
(v) නිලධාරීහු ආරක්ෂක භටයන් ලවා මඟ යනෙන මිනිසුන් හා වාහන පරීක්ෂා කරවති.

i. ඇමතිතුමා විසින් නව ලේකම්වරියක් පත් කෙරෙයි/ කරනු ලබයි/ ලැබෙයි.

ii. අභිගුණ්ඨිකයා විසින් නයි දෙන්නෙක් අල්ලා ගැනෙති/ ගැනෙත්, ගනු ලබති/ ලැබෙති/ ලබත්/ ලැබෙත්.

iii.. ශාලාධිපතිවරයා විසින් නීති උල්ලංඝනය කළ සිසුවෙක් ශාලාවෙන් ඉවත් කෙරුණේය/ කෙරිණි/ කරනු ලැබිණ/ ලැබිණි/ ලැබුණේය/ ලැබීය/ ලැබුවේය/ කරන ලද්දේය/ කරනා ලද්දේය/ කරන ලදි/ කරනා ලදි.

iv. සිරි රහල් හිමියන් විසින් කාව්‍යශේඛරය රචනා කෙරිණ/ කෙරිණි/ කෙරුණේය/ කරනු ලැබිණ/ ලැබිණි/ ලැබුණේය/ ලැබීය/ ලැබුවේය/ කරන ලද්දේය/ කරනා ලද්දේය/ කරන ලදී/ කරනා ලදී.

v. නිලධාරීන් විසින් ආරක්ෂක භටයන් ලවා මඟ යනෙන මිනිස්සු හා වාහන පරීක්ෂා කෙරවෙති/ කෙරවෙත්/ කරවනු ලබති/ කරවනු ලැබෙති/ කරවනු ලබත්/ ලැබෙත්.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ඉ) ව්‍යාකරණානුකූල වාක්‍යයක් නිර්මාණය කිරීමට යෝග්‍ය පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (පරිසරවේදීහු/පරිසරවේදීන්) වන සංරක්ෂණය සඳහා (ශිෂ්‍යයෝ/ශිෂ්‍යයන්) යොමු කළහ.
(ii) ජනප්‍රිය (නිළියක්/නිළියක) රූස්විම අමතතොත් (ඡන්දදායකයෝ/ඡන්දදායකයන්) සතුටු වනු ඇත.
(iii) (ශිෂ්‍ය නායකයන්/ශිෂ්‍ය නායකයෝ) විසින් (නවක සිසුහු/නවක සිසුන්) පිළිගනු ලැබූහ.
(iv) අම්මා හා තාත්තා සමඟ (මා/මම) ද උත්සවයට සහභාගි (වීමු/වීමි).
(v) (ව්‍යාපාරිකයන්/ව්‍යාපාරිකයෝ) පරිසරය විනාශ කරද්දී (දේශපාලකයෝ/දේශපාලකයන්) නිලධාරීන්ට තර්ජනය කරති.

i. පරිසරවේදීහු - ශිෂ්‍යයන්
ii. නිළියක - ඡන්දදායකයන්
iii. ශිෂ්‍ය නායකයන් - නවක සිසුහු
iv. මම - වීමි
v. ව්‍යාපාරිකයන් - දේශපාලකයෝ

(ලකුණු 01 x 5 = 05 යි.)

5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **කීර්තිමත් ප්‍රදේශාධිපතියෝ ගුණදහමින්** ආඪ්‍ය ව සිටිති.
(**කීර්තිමත්** - තද්ධිත, **ප්‍රදේශාධිපති** - සන්ධි, **ගුණදහම්** - සමාස)

(ii) **තුරුවදුලෙහි සුපිපි වනමල්** එහි ම මිලින ව යයි.
(**තුරුවදුලෙහි** - විභක්ති, **සුපිපි** - උපසර්ග, **වනමල්** - සමාස)

(iii) **විනිසකරු** අංක 70 **දරන** නඩුව **නිෂ්ප්‍රභ** කරයි.
(**විනිසකරු** - සමාස, **දරන** - කෘදන්ත, **නිෂ්ප්‍රභ** - උපසර්ග)

(iv) රූබර ලලනාවෝ **මිණිබරණ ද රනබරණ** ද අභිරුචියෙන් පලඳිති.
(**මිණිබරණ** - සන්ධි, **ද** - නිපාත, **රනබරණ** - සන්ධි)

(v) **අකෘතඥයෝ පාපතර** ක්‍රියාවන්හි **ම** නිරත වෙති.
(**අකෘතඥයෝ** - විභක්ති, **පාපතර** - තද්ධිත, **ම** - නිපාත) (ලකුණු 03 × 5 =15 යි.)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| i කීර්තිමත් | තද්ධිත | අස්ත්‍යර්ථය/ ඇත යන අර්ථය |
| ප්‍රදේශාධිපති | සන්ධි | සමාන ස්වර දීර්ඝ/ සවර්ණ ස්වර දීර්ඝ/ ස්වර දීර්ඝ/ දීර්ඝ ස්වරාදේශ |
| ගුණදහම් | සමාස | දකාරාර්ථ සමාස/ ද අරුත් සමස් |
| ii තුරුවදුලෙහි | විභක්ති | ආධාර විභක්ති/ අදර විබත් |
| සුපිපි | උපසර්ග | වඩා යන අර්ථය / අධික යන අර්ථය / අර්ථෝද්දීපනය කිරීම් අර්ථය / භූෂණාර්ථය / |
| වනමල් | සමාස | විභක්ති සමාස/ විබත් සමස්/ ආධාර විභක්ති සමාස/ අදර විබත් සමස් |
| iii විනිසකරු | සමාස | විභක්ති සමාස/ විබත් සමස්/ කර්ම විභක්ති සමාස/ කම් විබත් සමස් |
| දරන | කෘදන්ත | වර්තමාන කෘදන්ත/ කර්තෘකාරක වර්තමාන කෘදන්ත |
| නිෂ්ප්‍රභ | උපසර්ග | දූෂ්‍යාර්ථය/ කුත්සිතාර්ථය/ නින්දිත අර්ථය / |
| iv මිණිබරණ | සන්ධි | පරස්වර ලෝප සන්ධිය/ පර සර ලොප් සඳ |
| ද | නිපාත | සමුච්චයාර්ථ |
| රණබරණ | සන්ධි | ස්වර සන්ධිය/ සර සඳ/ ආරෝහණ සන්ධිය |
| v අකෘතඥයෝ | විභක්ති | ප්‍රථමා විභක්තිය / පෙර විබත් |
| පාපතර | තද්ධිත | අධික යන අර්ථයේ/ වඩා යන අර්ථයේ/ (තුලනාර්ථයේ) / |
| ම | නිපාත | අවධාරණාර්ථයේ |

(ලකුණු (01 x 3) x 5 = 15 යි.)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට අර්ථානුකූල ව වඩාත් ම ගැළපෙන වචනය වරහනින් තෝරා ලියන්න.

(i) ...................... කියවිය හැකි සන්දේශ සිංහල සන්දේශාවලියෙහි සුලබ නො වේ.

(ii) නැකත් බලවන, පෙරනිමිති සලකන මිනිසුන් ...................... පාත්‍ර කරන කථා වස්තු ජාතක පොතෙහි හිඟ නො වේ.

(iii) මිනිසාගේ චින්තනයට භාෂාව කෙතෙක් දුරට උපකාරී වේ ද යන්න ...................... ප්‍රශ්නයකි.

(iv) ලක්වැසි ජනතාව තුළ තමන් සිංහලයන් ය යන හැඟීම ක්‍රියාත්මක වූයේ කවර කලෙක පටන් ද යන්න මෑතක සිට ඇතැම් උගතුන් අතර ...................... ප්‍රශ්නයක් බවට පත් වී තිබේ.

(v) ශෛලිය හා වාග්විලාසය සකස් වීම කෙරෙහි ලේඛනයේ ...................... ද බල පාන බවට මෙය සාධකයකි.

(vi) සමකාලීන භාෂණ ව්‍යවහාරය ලේඛන කාර්යය සඳහා යොදා ගැනීමේ ...................... ඇල්බට් ද සිල්වා මිදුණු බව පෙනේ.

(විවාදාත්මක, නවතාවයෙන්, මනෝවිද්‍යාත්මක, වස්තු විෂයය, සම්ප්‍රදායයෙන්, පරිභාසයට)

(අ)

i. නවතාවයෙන්
ii. පරිභාසයට
iii. මනෝවිද්‍යාත්මක
iv. විවාදාත්මක
v. වස්තු විෂයය
vi. සම්ප්‍රදායයෙන්

(ලකුණු ½ x 6 = 03 යි.)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

පරාක්‍රමබාහු මුළු දිවයිනට ම අදිපති වී අබිසේක ලැබුවට පස්සේ පොලොන්නරුවේ තැනවූ මාලිගාව පඬුවස් නුවර මාලිගාවට සමාන නමුත් මහතින් ඊට ලොකු යි.

පරාක්‍රමබාහු මුළු දිවයිනට ම අධිපති වී අභිෂේක ලැබීමෙන් පසු පොළොන්නරුවේ තැනවූ මාලිගාව පඬුවස් නුවර මාලිගාවට සමාන නමුත් ප්‍රමාණයෙන් (පළලින්) ඊට විශාල ය.

(ලකුණු ½ x 6 = 03 යි.)

(ඇ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) බල්ලා **බළලා** එළවා දමයි.
(ii) **බළලා** මීයා මරයි.
(iii) **ගසෙහි** අත්තක් කඩා වැටේ.
(iv) කුරුල්ලෙක් **ගසෙහි** වසයි.
(v) ළමයා **ගසට** වතුර දමයි.
(vi) ළමයා **අතින්** පොත බිමට වැටෙයි.

i. බළලා :- කර්ම විභක්තිය / කම් විබත්

ii. බළලා :- ප්‍රථමා විභක්තිය / පෙර විබත්

iii. ගසෙහි :- සම්බන්ධ විභක්තිය / සබඳ විබත්

iv. ගසෙහි :- ආධාර විභක්තිය / අදර විබත්

v. ගසට :- සම්ප්‍රදාන විභක්තිය / සපදන් විබත් / බර ව

vi. අතින් :- අවධි විභක්තිය / අවදි විබත්

(ලකුණු ½ x 6 = 03 යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.
එහෙත් භාෂණය කරන්නේ සමාජය සමස්තයක් වශයෙන් නො වේ භාෂක සමාජයේ සාමාජිකයන් එනම් පුද්ගලයන් වශයෙනි එසේ නම් එය පෞද්ගලික වූවකැයි නො කිව යුතු ද

(ඊ) එහෙත් භාෂණය කරන්නේ සමාජය සමස්තයක් වශයෙන් නො වේ. භාෂක සමාජයේ සමාජිකයන් එනම්, පුද්ගලයන් වශයෙනි. එසේ නම්, එය පෞද්ගලික වූවකැ'යි නො කිව යුතු ද?

(ලකුණු ½ x 6 = 03 යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) රාජ පුරුෂයන්ගේ බස් ඇසූ රජ "පුරෝහිතයා කෙසේ මරම් ද"යි කී ය.

(ii) "යන්නට එපා, අත්ත කඩා ගෙන වැටෙයි" යනුවෙන් යාළුවෝ කීහ.

(iii) "යුෂ්මතාගේ නිර්දෝෂීභාවයට යමක් ඇත්නම් කියන්න" යි විනිශ්චයකාරවරයා පැවසී ය.

(ලකුණු 01 x 03 = 03 යි.)

(උ)

i. රාජ පුරුෂයන්ගේ බස් ඇසූ රජ පුරෝහිතයා මරන ආකාරය/ ඇයුරු ගැන ඇසී ය/ විමසී ය

ii. • නොයන ලෙසත් අත්ත කඩා වැටිය හැකි බවත් යහළුවෝ කීහ.
  • අත්ත කඩා වැටිය හැකි බැවින් නොයන ලෙස යහළුවෝ කීහ

iii. ඔහුගේ නිර්දෝෂීභාවයට යමක් ඇතිනම් කියන ලෙස විනිශ්චයකාරවරයා පැවසීය.

(ලකුණු 01 x 03 = 03 යි.)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලක්දිව **ඓතිහාසිකත්වයෙන්** සැලකෙන **ආදිතම** ජනාවාස පිහිටුවූ යුගය වශයෙන් **උපකල්පිත** වූ කාලයෙහි සිට සියවස් දෙක හමාරක් පමණ වූ කාල පරිච්ඡේදයක් ඇතුළත, එනම් ක්‍රි. පූ. 3 සියවසේ දී මේ රටේ බුදු සසුන **සංස්ථාපිත** වූ තැන් පටන් චිරස්ථායි වන අයුරින් ලියැවුණු **පුරාලිපි** රැසක් ද අනුරාධපුර අවධියේ **ද්විතීය** භාගයට අයත් සීගිරි කුරුටු ගී ඇතුළු සාහිත්‍යමය ලේඛන හා ග්‍රන්ථ කීපයක් ද අප සතු ව තිබේ. මෙසේ සිංහල භාෂාවෙන් වාර්තාගත වී ඇති ආදිතම ලේඛන වන සිය ගණනක් පුරාලිපි හා ග්‍රන්ථ කීපය අතුරෙන් අඩු තරමින් භාෂා ඉතිහාසයේ යුග ලක්ෂණ නියෝජකත්වය අතින් වැදගත් සේ පෙනෙන ලිපි සැහෙන ප්‍රමාණයක් වත් පරීක්ෂා කර බැලීමෙන්, වඩාත් හේතු යුක්ති ඇත්තේ ඉහත කී මන්වන්තර අතුරෙහි කවර මතයකට ද යන්න මෙන් ම භාෂාවේ පරිණාමය සිදු වී ඇත්තේ කවර අයුරින් ද යන්නත් කමන්ට ම ප්‍රත්‍යක්ෂ ලෙස වටහා ගත හැකි වේ.

(i) **කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

(ii) පිහිටුවූ, ඉතිහාසයේ, කුරුටු ගී යන වචනවල යෙදී ඇති පිලි හඳුන්වන්න.

(iii) මෙම ඡේදයේ ඇතුළත් තද්ධිත පද **තුනක්** උපුටා දක්වන්න.

(iv) මේ ඡේදයේ ඇතුළත් ව්‍යංජන සංයුක්ත තුනක් සමග මූර්ධජ ඌෂ්මාක්ෂරයක් ඇතුළත් වචනයක් උපුටා දක්වන්න.

(v) ජනාවාස, මන්වන්තර, වාර්තාගත යන වචන විසන්ධි කොට දක්වන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

i. • ආදිතම, උපකල්පිත වූ, ඓතිහාසිකත්වයෙන්, ද්විතීය පුරාලිපි, සංස්ථාපිත

(ලකුණු 03 යි.)

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

### විද්‍යා - ගණිත

- 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- 12-13 රසායන විද්‍යාව - 1
- 12-13 රසායන විද්‍යාව - 2
- 12-13 රසායන විද්‍යාව - 3
- 12-13 රසායන විද්‍යාව - 4
- 12-13 රසායන විද්‍යාව - 5
- 12-13 භෞතික විද්‍යාව - 1
- 12-13 භෞතික විද්‍යාව - 2
- 12-13 භෞතික විද්‍යාව - 3
- 12-13 භෞතික විද්‍යාව - 4
- 12-13 භෞතික විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 1
- 12-13 ජීව විද්‍යාව - 2
- 12-13 ජීව විද්‍යාව - 3
- 12-13 ජීව විද්‍යාව - 4
- 12-13 ජීව විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- 12-13 කෘෂි විද්‍යාව - 1
- 12-13 කෘෂි විද්‍යාව - 2
- 12-13 කෘෂි විද්‍යාව - 3
- 12-13 කෘෂි විද්‍යාව - 4

### වාණිජ්‍යය

- 12 ගිණුම්කරණය
- 13 ගිණුම්කරණය
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 13 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව
- 13 ආර්ථික විද්‍යාව - 1
- 13 ආර්ථික විද්‍යාව - 2

### කලා

- 12 සිංහල
- 13 සිංහල
- 12 දේශපාලන විද්‍යාව
- 13 දේශපාලන විද්‍යාව
- 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- 12 ඉන්දියානු ඉතිහාසය
- 13 ඉන්දියානු ඉතිහාසය
- 12 භූගෝල විද්‍යාව
- 13 භූගෝල විද්‍යාව
- 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes

**English Medium**

- 12 Accounting
- 13 Accounting
- 12 Business Studies
- 13 Business Studies
- 12 Economics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සාමාන්‍ය දැනීම
- 12 ගිණුම්කරණය - 1
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.